# රෙඩ්ෆීල්ඩ්ගේ මහා සම්ප්‍රදාය

ඇමරිකානු මානවවිද්‍යාඥයකු වූ රෙඩ්ෆීල්ඩ් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඊනියා මහා සම්ප්‍රදාය හා චූල සම්ප්‍රදාය පිළිබඳ අපි සාකච්ඡා කර ඇත්තෙමු. මේ ප්‍රවාදය සිංහල පාඨකයාට හඳුන්වා දුන්නේ, ඉංගිරිසියෙන් තිබූ ප්‍රවාදය කිසිදු විචාරයකට ලක් නොකර සිංහලට පරිවර්තනය කර ඊනියා උගතුන් අතර ප්‍රචලිත කිරීමට කටයුතු කෙළේ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා ය. මාර්ටින් වික්‍රමසිංහ මහතා මෙන් ම සරච්චන්ද්‍ර මහතා ද සිංහල පාඨකයාට යම් යම් හඳුන්වාදීම් කර ඇත. ඒ දෙදෙනා ම සිංහල සංස්කෘතිය ගැන මොන දේ ලියුව ද අවසාන වශයෙන් සේවය කර ඇත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට ය.

රෙඩ්ෆීල්ඩ් මහතාගේ ප්‍රවාදයෙහි හරය වූයේ ඇතැම් රටක ඇති ඊනියා මහා සංස්කෘතියක සමහර අංග අනෙක් රටවල ඇති ඊනියා චූල සංස්කෘතීන් යටපත් කරමින් පැතිර යෑම ය. ඉගෙන ගත්තවුන් යැයි කියන්නන්ගෙන් වැඩි පිරිසක් මහා සම්ප්‍රදාය ගැන අඩු තරමින් අසාවත් ඇතැයි අපි සිතමු.  ඔවුන් මහත් අභිරුචියකින් මේ සංකල්පය යොදාගන්නා ආකාරයෙන් පෙනී යන්නේ ඔවුන්ට ඒ ගැන විශ්වාසයක් ඇති බව ය.

මහා සම්ප්‍රදාය, මහා සංස්කෘතිය ආදී සංකල්ප අවසාන වශයෙන් සේවය කරන්නේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට ය. රෙඩ්ෆීල්ඩ්ගේ ප්‍රවාදයෙහි අරමුණ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ලෝ පුරා ප්‍රචලිතකිරීම යුක්තියුක්ත කිරීම ය. අද විවිධ මාර්ගවලින්, දේශපාලන ක්‍රියාමාර්ගයක් ලෙස සංස්කෘතික අධිපතිවාදයක් ලෙස වරප්‍රසාද, සම්මාන ආදිය පිරිනමමින් සමස්තයක් ලෙස ගත්කල බටහිර දැනුම ලෝ පුරා ප්‍රචලිත කෙරෙයි; තහවුරු කෙරෙයි.

වැඩවසම් යුගයේ නිර්මාණයක් වූ බටහිර ශාස්ත්‍රීය සංගීතය ද ප්‍රචලිත කෙරෙන්නේත් තහවුරු කෙරෙන්නේත් ඒ සංගීතය නිර්මාණය කළවුන්ගේ දක්ෂතාවකට හෝ සංගීතයෙහි ඇති රසයකට හෝ වඩා දේශපාලන හා සංස්කෘතික ආධිපත්‍යයේ බලමහිමයෙහි. යම් අයුරකින් භාරතයට ලෝක ආධිපත්‍යයක් තිබිණි නම් බටහිර රටවල ද අධිපතිවාදී ශාස්ත්‍රීය සංගීතය වනුයේ උත්තර භාරතීය රාගධාරී සංගීතය ය.

බටහිර විද්‍යාව හා ඒ මත පදනම් වූ බටහිර වෛද්‍ය විද්‍යාව ද ඇතුළු බටහිර තාක්ෂණය (වෛද්‍ය විද්‍යාව ද තාක්ෂණයක් බව අමතක නොකළ යුතු ය) අද ප්‍රධාන දැනුම් පද්ධතිය බවට පත්වී ඇත්තේ ද එහි ඇති විස්කම් ගුණයක් නිසා නොව ඒ පිටුපස බටහිර දේශපාලන හා සංස්කෘතික ආධිපත්‍යය ඇති බැවිනි. බටහිර විද්‍යාව හා බටහිර ගණිතය ඉතාමත් දුර්වල න්‍යායක් (logic) හා දර්ශනයක් මත ගොඩනැගී ඇත. එහෙත් ඒ අනෙක් සියළු දැනුම් පද්ධතීන් මර්දනය කරමින් නැගී සිටින්නේ අධිපතිවාදී දේශපාලනය හා සංස්කෘතිය හේතුකොටගෙන ය.

රෙඩ්ෆීල්ඩ්ගේ සංකල්පවලට හා මතවාදවලට මූලික වශයෙන් පිළිගැනීමක් ලැබෙන්නේ ද ඒ හා සම්බන්ධ දේශපාලන හා සංස්කෘතික ආධිපත්‍යය හේතුකොටගෙන ය. ඒ සියළු මතවාද බටහිර විශ්වවිද්‍යාල ඔස්සේ ලෝකයේ අනෙක් රටවල විශ්වවිද්‍යාලවලට ව්‍යාප්ත කෙරෙයි. අනෙක් රටවල උපාධි පිළිගැනෙන්නේ ඒ විශ්වවිද්‍යාල බටහිර රටවල් පිළිගන්නා මතවාද සංකල්ප ආදිය උගන්වන්නේ නම් පමණකි. ඊනියා පිළිගැනීම යන්න අප නොදැනුවත්ව ම අප පාලනය කිරීමට යොදා ගැනෙයි. අපේ රටවල විශ්වවිද්‍යාල උපාධි අවසන් වශයෙන් පිළිගැනෙන්නේ කවුරුන් විසින් ද? ඒ ඉතා පැහැදිළි ය. අප ඒ පිළිගැනීම ලබාගත යුත්තේ බටහිර රටවලින් ය. එනම් බටහිර විශ්වවිද්‍යාලවලින් ය. එහි දී අප ඔවුන්ට අවශ්‍ය දෑ ඉගැන්විය යුතු ය.

අද ලෝකයේ සංස්කෘතීන් ප්‍රචලිත කෙරෙන්නේ ඒ සම්බන්ධයෙන් බටහිරයන් විසින් නිර්මාණය කෙරී ඇති මධ්‍යම පංතියක් ඇසුරෙන් ය. මේ මධ්‍යම පංතියට ඒ ඒ රටවල ආධිපත්‍යයක් ලැබී ඇත. ඒ ආධිපත්‍යය ඔවුන්ට ලබා දී ඇත්තේ ඔවුන් සතු දැනුම හා ආර්ථික ශක්තිය හේතුකොටගෙන ය. අද වන විට බටහිර විශ්වවිද්‍යාලයක උපාධිධාරියකුට ලංකාවේ ප්‍රාචීන පණ්ඩිත පරීක්ෂණයෙන් සමත් අයකුට වඩා පිළිගැනීමක් වෙයි. මේ පිළිගැනීම ලැබී

© Prof. Nalin De Silva

ඇත්තේ උපාධියේ ගුණාත්මක භාවය වැඩි නිසා නොව බටහිර දේශපාලන හා සංස්කෘතික ආධිපත්‍යය හේතුකොටගෙන ය.

රටක මධ්‍යම පංතිය විසින් මතවාදී නායකත්වය  සපයනු ලැබෙයි. අපේ රටේ මතවාදී නායකත්වය විශ්වවිද්‍යාල, පාසල්  හා ජනමාධ්‍ය ඔස්සේ මධ්‍යම පංතියෙන් සැපයෙයි. එදා මතවාදී නායකත්වය සපයනු ලැබුවේ පිරිවෙන හා පංසල ඔස්සේ භික්ෂූන් වහන්සේ විසිනි. එහෙත් අද භික්ෂූන් වහන්සේගේ නායකත්වය හුදු නාමික නායකත්වයක් බවට පත්කිරීමට උත්සාහ ගැනෙයි. භික්ෂූන් වහන්සේ දරණ මතය ජනමාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කෙරෙන බව සැබෑ ය. එහෙත් අද ඒ ඇතැම් මතයකට සවන් දෙන්නෝ කවරහු ද? අද තරුණ තරුණියන්ගෙන් කී දෙනෙක් අධ්‍යාපනික කරුණක් සම්බන්ධයෙන් අවවාදයක් උපදේශයක් ලබාගැනීමට පංසලට යත් ද? දැනුම සම්බන්ධයෙන් ගත්කල භික්ෂූන් වහන්සේට ඇති ආධිපත්‍යය කවරේ ද? භික්ෂූන් වහන්සේ වෙනුවට රාජ්‍ය නොවන අනුකාරක උගතා හා විශ්වවිද්‍යාල ආචාර්යවරයා ආදේශකිරීමට උත්සාහ ගැනෙයි.

එහෙත් මෙයින් කියැවෙන්නේ භික්ෂූන් වහන්සේගේ සංස්කෘතික ආධිපත්‍යය මුළුමනින් ම නැති වී ගොස් ඇත ය යන්න නො වේ. අද ලෝකයේ මහා සම්ප්‍රදාය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි සම්ප්‍රදාය ය. එය ඒ ඒ රටවල මධ්‍යම පංතියෙහි ද අධ්‍යාපනික සම්ප්‍රදාය බවට පත් කෙරී ඇත. එහෙත් රෙඩ්ෆීල්ඩ්ගේ මතවාදය අභියෝගයට ලක්කරමින් තවමත් ඒ ඒ රටවල වෙනත් සම්ප්‍රදායන් ද ක්‍රියාත්මක වෙයි. විශේෂයෙන් ම මධ්‍යම පංතික නොවන පංතියක් ඔස්සේ ඒ අනෙක් සම්ප්‍රදායයන් ක්‍රියාත්මක වෙයි.

එහෙත් පුදුමය එය නො වෙයි. මධ්‍යම පංතිය ද ඇතැම් අවස්ථාවල බටහිර ජ්නියා මහා සම්ප්‍රදාය වූ ක්‍රිස්තියානි සම්ප්‍රදායයෙන් වෙන් වී ජ්නියා චුල සම්ප්‍රදාය ලෙස හැඳින්වෙන වෙනත් සම්ප්‍රදායයන්හි කටයුතු කිරීම ය. උදාහරණයක් ලෙස මෙරට මධ්‍යම පංතිය ගතහොත් එහි සාමාජිකයන් ද භික්ෂූන් වහන්සේ ද එකට වැඩකරන අවස්ථා දැකිය හැකිවෙයි. එහිදී භික්ෂූන් වහන්සේගේ නායකත්වය අනුගමනය කරමින් මධ්‍යම පංතිය ක්‍රියා කරන්නේ යැයි අපි නො කියමු. එහි දී සිදුවන්නේ මධ්‍යම පංතිය හා භික්ෂූන් වහන්සේ එකට එක රාමුවක් තුළ වැඩකිරීම ය.

මෙරට ඇතැයි කියන ජනවාර්ගික ප්‍රශ්නය එයට උදාහරණයක් වෙයි. මාක්ස්වාදය ඇසුරෙන් හා ලිබරල් වාදය ඇසුරෙන් අවුල් ලොවක් නිර්මාණය කර මෙරට සිංහලයන් විශේෂයෙන් ම සිංහල බෞද්ධයන් අනෙක් ජනවර්ග මර්දනය කර ඇති බවට මතයක් ප්‍රචලිත කිරීමට බටහිර උගතුන් සමත් වී ඇත. එහෙත් අද මේ මතය පිළිගනු ලබන්නේ මෙරට මධ්‍යම පංතියේ ඉතා සුළු පිරිසක් විසින් පමණකි. මේ පිරිසට මාධ්‍යයෙහි ආධිපත්‍යයක් ලබා දී ඇත. එබැවින් ඔවුන්ගේ මත තොරතෝංචියක් නොමැතිව උදේ හවස ප්‍රචාරය කෙරෙයි. එහෙත් මධ්‍යම පංතියේ ද බහුතරය අද ඒ මතය නො පිළිගනියි. ඒ බහුතරය  හා භික්ෂූන් වහන්සේ වෙනත් එකම මතයක් දරණු දැකිය හැකි ය.

බටහිර සංස්කෘතික, දේශපාලනික හා ආර්ථික ආධිපත්‍යය ඔස්සේ අපේ රටේ ද වෙනත් ජ්නියා තුන්වැනි ලෝකයේ රටවල ද බටහිර උගතුන් අනුකරණය කරන මධ්‍යම පංතියක් ගොඩනඟා ඇති නමුත් ඒ මධ්‍යම පංතියට සමාජයේ විවිධ බලතල, වරප්‍රසාද හිමිකර ඇති නමුත් බටහිරයන්ට ඇතැම් වැදගත් කරුණුවලදී පවා තම මතය ඒ මධ්‍යම පංතියට කාවැද්දීමට නොහැකි වී ඇත. අප සාකච්ඡා කිරීමට බලාපොරොත්තුවන්නේ මේ හා සම්බන්ධ වඩාත් සාධාරණීය වූ කරුණකි. සංස්කෘතීන් නිර්මාණයවන්නේ හා පැතිරයන්නේ කෙසේ ද?

මේ ප්‍රශ්නයට වඩා සාධාරණ (general) පිළිතුරක් අවශ්‍යවන්නේ බටහිරයන් විසින් ප්‍රචාරය කෙරෙන ඇතැම් බොරු හෙළිදරව් කළ යුතුව ද ඇති බැවිනි. බටහිරයන් නොඑන්නට මෙරට මුස්ලිම් ආධිපත්‍යයකට ගොදුරුවීමට ඉඩ තිබුණි ද? අපි පැහැදිලිව ම නැතැයි කියමු. අනෙක් අතට බටහිරයන් පැමිණීයේ මෙරට බුද්ධාගම ආරක්ෂාකිරීමට ඇති වූ යහපත් චේතනාවක් කරණකොට ගෙන ද? මුස්ලිම්වරුන්ට ද වඩා දරුණු ක්‍රම උපයෝගී කරගනිමින් බුදුසසුන නැසීමට ක්‍රියා කළ පෘතුගීසීන්ට සසුන නැතිකර කතෝලික ආගම මෙරට ප්‍රචලිතකිරීමට නොහැකි වූයේ ඇයි? දෙමවුපියන් කතෝලික ආගම වැළඳ නොගතහොත් ළදරුවන් උඩ විසිකර ඔවුන් වැටෙන විට කඩුව ඇල්ලීමට තර්ජනය කළ ද, වෙනත් ක්‍රම අනුගමනය කළ ද, පූර්ණ රාජ්‍ය බලය යෙදුව ද පෘතුගීසීන්ට කතෝලික ආගමට හරවාගත හැකි වූයේ සිංහලයන්ගෙන් කීයෙන් කී දෙනා ද?  මුස්ලිම් ආක්‍රමණයෙන් බුදුසසුන බේරාගත්තේ පෘතුගීසීන්  යැයි කියන පඬියන්

© Prof. Nalin De Silva

බුදුසසුන පෘතුගීසීන්ගෙන් බේරාගත්තේ ලන්දේසීන් යැයි ද, ඒ ලන්දේසීන්ගෙන් බේරාගත්තේ ඉංගිරිසින් යැයි ද කියන්නේ ද? සියළු වරප්‍රසාද දී ද, සිංහල බෞද්ධයන්ට කළහැකි උපරිම හිරිහැර වධහිංසා කිරීමෙන් පසුව ද, රාජ්‍ය බලය පූර්ණ ව යෙදීමෙන් පසුව ද අබෞද්ධ වූ සිංහලයන්ගේ ප්‍රතිශතය අඩුව පවතින්නේ කිනම් බලමහිමයකින් ද?

මිහිඳු හිමියන් මෙරටට වැඩම කිරීමට පෙර මෙහි බෞද්ධයන් සිටි බව දැනගැනීමට විශාරද පඬි මොළයක් අවශ්‍ය නො වෙයි. බුදුන්වහන්සේ මෙරටට වැඩම කෙළේ නම් එකළ ද මෙහි බෞද්ධයන් නොවී යැයි කියන්නේ කෙසේ ද? අප පුන පුනා කියා ඇත්තේ දේවානම්පිය තිස්ස රජු දවස සිදුවූයේ මෙරට නිල වශයෙන් බුදුසසුන පිහිටුවනු ලැබිණ යන්න ය. දේවානම්පිය තිස්ස රජු බෞද්ධයකු වී බණ අසා ආරාම පූජාකර දැන් මෙරට බුදුසසුන පිහිටුවනු ලැබිණ දැයි මිහිඳු හිමියන්ගෙන් විමසූ කල උන්වහන්සේ පිළිතුරු දුන්නේ නැත යනුවෙනි. රටක බෞද්ධයන් සිටීමෙන් පමණක් ඒ රටෙහි බුදුසසුන පිහිටුවනු නො ලැබෙයි. මිහිඳු හිමියන් පවසා ඇත්තේ රටෙහි උපන් අයකු පැවිදි වී උපසම්පදා වී ධර්මය දේශනාකිරීමෙන් පමණක් රටෙහි බුදුසුසුන පිහිටුවනු ලැබෙන බව ය.

දේවානම්පිය තිස්ස රජුගෙන් පසුව මෙරට බුදුසමය පැතිරී ගියේ රාජ්‍යානුග්‍රහය ලැබුණු නිසා යැයි ඇතැම් පඬියෝ කියති. එසේ නම් කතෝලික පෘතුගීසීන් ඒ රාජ්‍යානුග්‍රහය අස්කර කතෝලික ආගමට රාජ්‍යානුග්‍රහය ලබාදීමෙන් පසුව පෘතුගීසීන්ට යටත් වූ පෙදෙස්වල කතෝලික ආගම ලැව්ගින්නක් සේ පැතිර යා යුතු ය. එහෙත් ඒ එසේ නො වී ය. අද ලෝකයේ ඊනියා මහා සම්ප්‍රදාය ක්‍රිස්තියානි සම්ප්‍රදාය වී තිබියදීත් අප තවමත් බෞද්ධ සංස්කෘතියෙහි ජීවත්වන්නේ ඇමරිකානුවන්ගේ කරුණාවක් නිසා ද? එසේත් නැත්නම් රෙඩ්ෆීල්ඩ්ට වැරදුනු නිසා ද? අපට පිළිතුරු දීමට සිදු වී ඇත්තේ මේ ආදී වූ සියළු ප්‍රශ්නවලට ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva